


**ශ්‍රී. බු. ව. 2560 ක්වූ දුරුතු මස කලාපය, රා. ව. 2017 ක් වූ ජනවාරි මස 12 වන දින**

**මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙවිනුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති**

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

## මුල් බුදුසමයෙහි ඉගැන්වෙන කර්ම සංකල්පය කරුමයක් කර නොගනිමු.

ගරු ස්වාමින් වහන්ස, කාරුණික පින්වත්නි,

අද දුරුතු පුර පසළොස්වක පොහොය දිනයයි. දෙදහස් දහත වර්ෂයේ මුල්ම පොහොය දිනයයි. බුදුරජාණන් වහන්සේ පළමුවරට ලංකාවේ මහියංගන ප්‍රදේශයේ මහානාගවන නම් රමණීය උයන වෙත වැඩම කළේ අද වැනි පොහොය දිනයකය. එදා මහියංගන ප්‍රදේශයේ ජීවත් වූයේ හැඩි දැඩි ගති වලින් යුක්ත යක්ෂ ගෝත්‍රිකයෝය. එම යක්ෂයින් දමනය කළ බුදුන්වහන්සේ ඔවුන්ගේ දෙලොව දියුණුව සඳහා ධර්මය දේශනා කළ සේක. එදා යක්ෂයින් දමනය කළ මුත් නූතනයේ සමාජය තුළ එවැනි යකුන් හා යක්ෂණියන් බෙහෙවින් සිටින බව පෙනේ. එවැනි අය දකින විට බොහෝ දෙනා කියන්නේ ඔවුන්ගේ කරුම ගතිය නිසා එසේ වී ඇති බවයි. ඒ නිසා සියල්ල කර්මයට පවරා කටයුතු කරන අයට සිදුවිය හැකි අනර්ථය පැහැදිලි කර දීම මේ සදහම් පණිවිඩයේ අරමුණයි.

ලෝකයේ බිහිවූ විවිධ ආගමික චින්තකයින් හැමෝම කර්මය ගැන අදහස් පළකර තිබේ. බමුණු චින්තනය ඇතුළු ප්‍රාග් බෞද්ධ හැම ආගමකම මේ කර්මය ගැන විස්තර කර තිබේ. එම කර්ම වාද වල තිබෙන සාවද්‍ය බව පෙන්වා දෙමින් කර්මය පිළිබඳ සරල විවරණයක් ඉදිරිපත් කර ඇත්තේ ගෞතම බුදුරජාණන් වහන්සේය.

අංගුත්තර නිකායේ තික නිපාතයේ මහා තිත්ථායතන සූත්‍රයෙහි කර්මය පිළිබඳ මත තුනක් ඉදිරිපත් කොට ඒවා වැරදි සහගත බවත්, එවැනි අදහස් පිළිගැනීමෙන් මිනිසා අකර්මන්‍ය, අප්‍රබුද්ධ පිරිසක් වන බවත් පෙන්වා දී තිබේ.

"සනති භිකඛවෙ එකෙ සමණ බ්‍රාහමණා එවං වාදිනො එවං දිට්ඨිනො යං කිඤචායං පුරිස පුගගලො පටිසංවෙදෙති. සුඛං වා දුකඛං වා අදුකඛ මසුඛංවා සබබං තං පුබෙබකත හෙතූති..... සබබං තං ඉසසර නිමමාණ හෙතූති ....... සබබං තං අහෙතු අපපචචයාති........."

"මහණෙනි සමහර මහණ බමුණෝ මෙබඳු අදහස්වල පිහිටා කටයුතු කරති. මිනිස් හැසිරීම් අනුව ඇතිවන සැප, දුක, සැපදුක අතර මැද යම් වේදනාවක් වේ නම් ඒවා මිනිසා විසින් කරන ලද පෙර කර්ම නිසා සිදුවන්නකි. ලෝකය නිර්මාණය කරන ලද සර්වබලධාරී ඊශ්වරගේ කැමැත්ත පරිදි සිදුවන්නකි. නැතිනම් කිසිදු හේතුවක් ප්‍රත්‍යයක් නොමැතිව සිදුවන්නකි".

සැප, දුක, සැපදුක අතරමැද වේදනා පිළිබඳ දක්වා තිබෙන මේ අදහස් තුනම බුද්දහම ප්‍රතික්ෂේප කරන්නේ ඒවා පිළිගතහොත් පුද්ගලයා නිෂ්ක්‍රීය පුද්ගලයෙක් බවට පත්වන නිසාය. ඊශ්වර නිර්මාණ වාදය පුබ්බේකත හේතුවාදය, අහේතු අප්පච්චය වාදය, යන මේවා සාරවශයෙන් ගෙන ඒවා පසුපස ගමන් කරන්නා වූ පුද්ගලයා මෙය කළ යුතුය. මෙය නොකළ යුතුයයි කැමැත්තක් ව්‍යායාමයක් ඇතිකර නොගනී. සියලු දේ අදෘශ්‍යමාන බලවේගවලට පවරා කටයුතු කරන එවැනි පුද්ගලයින් සමාජය තුල ජීවත්වන්නේ රූකඩ ලෙසිනි. මේ නිසා බුදුන්වහන්සේ ඒවා අකිරියවාද ලෙස ප්‍රතික්ෂේප කොට ඇත. නූතන සමාජය තුළත් එවැනි රූකඩ බොහෝ සෙයින් දැකගත හැකිය. තම මානව ශක්‍යතා ගැන විශ්වාස නොකරන ඔවුන් දේවාල පසුපස ගමන් කරමින් දෙවියන් ඉදිරියේ තමාට අවශ්‍ය සැප සම්පත් යදින බව පෙනේ. අපට ඒ සැප සම්පත් ලඟාකර ගත නොහැක. ඒවා දෙවියන් වහන්සේ හෙවත් ඊශ්වරගේ කාර්යයෝය. එනමුත් අපි ඊශ්වරගේ රූකඩ නොවෙමු. බෞද්ධ කර්ම සංකල්පය හරියට හඳුනා නොගත් අයට සිදුවී ඇති කරුමය මෙයයි. පුබ්බේකත හේතුවාදය සහ අහේතු අප්පච්ච වාදය යන ඉගැන්වීම් ද නූතන සමාජයට යෙදී තිබෙන එවැනි තවත් කරුම දෙකකි.

කර්මය පිළිබඳ වැරදි සහගත මත හතරක් සංයුක්ත නිකායේ අභිසමය සංයුත්තයෙහි අචේල කස්සප සූත්‍රයේදී බැහැර කර තිබේ. දුක තමා විසින් කරන ලද්දකි. (සයංකතං) අනුන් විසින් කරන ලද්දකි. (පරංකතං) දෙපක්ෂය විසින්ම කරන ලද්දකි. (සයංකතංච පරංකතංච) දුක තමා විසිනුත් අනුන් විසිනුත් නොකරන ලද්දේ ඉබේට සිදුවූවකි. (අසයං කාරං අපරංකාරං, අධිච්ච සමුපපනනං) මේ උත්තර හතර හමුවෙහි අචේල කස්සප බුදුන්වහන්සේගෙන් අසන්නේ දුකක් කියා දෙයක් නැත්ද ? දුක ගැන නොදනී ද? කියාය. බුදුන්වහන්සේ දේශනා කරන්නේ දුක ඇත. දුක ගැන දනිමි කියාය. ඉහත සඳහන් කළ ඉගැන්වීම ශාස්වත, උච්ඡේද ආදී ඉගැන්වීම්වලට සම්බන්ධ නිසා ඒවා ප්‍රතික්ෂේප කරන බුද්දහම දුක හා සැප ගැන කථා කරන්නේ පටිච්ච සමුත්පාද ක්‍රමයට අනුවයි. එසේ සිතා ක්‍රියා කරන අයට කර්මය කරුමයක් නොවේ.

දේව කේන්ද්‍රීය දෘෂ්ටිය සපුරා බැහැර කරමින් මානව කේන්ද්‍රීය ඉගැන්වීමක් අනුව සමාජය ගැන විවරණය කරන බුද්දහම උගන්වන කර්මය ගැන දැනුමක් ඇතිකර ගතහොත් කර්මය කරුමයක් කර නොගෙන සහනයෙන් ජීවත්විය හැකිය. කර්මය යනු අප සිතන තරම් සරළ අදහසක් නොවේ. එය සංකීර්ණ ක්‍රියාවලියකි. අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ අචින්තෙය්‍ය සූත්‍රය දක්වන පරිදි කරුණු හතරක් පිළිබඳව ප්‍රමාණය ඉක්මවා නොසිතිය යුතුයි. බුදුන්වහන්සේ, ධ්‍යාන, කර්ම විපාකය, ලෝකය, යනු එම හතරයි. එම ඉගැන්වීම් අතර කර්මය සහ කර්ම විපාකයද එවැනි ඉගැන්වීමකි. එම කර්මය ගැන ප්‍රමාණය ඉක්මවා සිතීමෙන් උමතුවිය හැකි බවටද එම සූත්‍රය දක්වයි. කර්මය ගැන එසේ වැඩියෙන් හිතන අය එය කරුමයක් කරගෙන සිටින බව පෙනේ. දෙදහස් දහතේ වර්ෂයේ වත් ඒ ගැන සිතා ක්‍රියාත්මක වීමට ගිහිපැවිදි අප හැමදෙනාම සිතට ගත යුතුයි.

හේතුඵල න්‍යාය අනුව ක්‍රියාකරන බුදුදහම කර්මය පුද්ගලයාට බලපාන ආකාරය ගැන සූත්‍ර රාශියකම විස්තර කර ඇත. මජ්ඣිම නිකායේ චූල්ලකම්ම විභංග සූත්‍රයේදී දේශනා කර ඇත්තේ.

"මහණෙනි මම චේතනාවට කර්මය යයි කියමි. පුද්ගලයා සිතාමතා කයින් වචනයෙන්, සිතින් කර්ම කරයි යනුවෙනි."

"චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි. චෙතයිත්වා කම්මං කරොති. කායෙන වාචාය, මනසා"

මේ අනුව බුදුදහම කර්මය ලෙස සලකන්නේ චේතනා සහගත සම්පූර්ණ ක්‍රියාවෝය. තිදෙර මෙහෙයවා කරනු ලබන කළු කර්මවලට කළු විපාකත්, සුදු කර්ම වලට සුදු විපාකත් ලැබෙන බව චූල්ල කම්ම විභංග සූත්‍රය සඳහන් කරයි. එම සූත්‍රය සඳහන් කරන පරිදි පුද්ගලයාගේ අනාගත ජන්මය විනිශ්චය කරනු ලබන්නේ සිතාමතා කරනු ලබන කර්මය මිස ඊශ්වර - පුබ්බේකත හේතුවාද අහේතු අප්පච්චයවාද වැනි බාහිර බලවේග නොවේ. සමාජගත පුද්ගලයා කර්මය දයාදකොට, උත්පත්තිය කොට ගෙන ඥාතියා කොට ගෙන, පිළිසරණ කොට ගෙන පවතිමින් ඔහු හීන, ප්‍රණීත වශයෙන් බෙදා දක්වන්නේ මේ කර්මයයි.

කර්මය නම් වූ සංකීර්ණ අදහස තේරුම් කරදීම සඳහා එහි ප්‍රභේද රාශියක් බෞද්ධ පොතපතේ සඳහන් වී ඇත. කර්මය විපාක දෙන කාල වශයෙන් කොටස් හතරකට බෙදා තිබේ. මේ ආත්ම භාවයේදීම විපාක දෙන කර්ම දිට්ඨධම්මවේදනීය කර්මයයි. දෙවන ආත්ම භාවයේදී විපාක දෙන කර්ම උපපජ්ජවේදනීය කර්මයයි. තෙවන ආත්ම භාවයේ සිට නිවන් දක්නා ජාතිදක්වා විපාක දෙන කර්ම අපරාපරිය කර්ම නම්. විපාක දීමට අවස්ථාවක් නොලැබ අහෝසි වී යන කර්ම අහෝසි කම්ම නම්.

විපාක දෙන ක්‍රම වශයෙන්ද කර්මය සතර ආකාර වේ. ගරුක, ආචිණ්ණ, ආසන්න, කටත්තා යනු ඒ ක්‍රම හතරයි. පුද්ගලයාට මුලින්ම බලපාන්නේ ඔහු විසින් කරන ලද හොඳ හෝ නරක ප්‍රබල කර්මයෝය. ඒවා ගරුක කර්ම නම්. පුද්ගලයා වැඩියෙන්ම පුරුදු පුහුණු කළ කර්ම දෙවනුවට විපාක දෙයි. ඒවා ආචිණ්ණ කර්ම නම්. මරණාසන්නයේදී සිතට එන කර්ම ආසණ්ණ කර්ම නම්. ඉහත කී ප්‍රබල කිසිදු කර්මයක් නැති විටෙක ඔහු විසින් කරන ලද දුර්වල කර්ම විපාක දේ. කටත්තා යනු එම කර්මයෝය.

කර්මයෙන් කෙරෙන කටයුතු වශයෙන්ද සතර ආකාර වේ. ජනක, උපත්ථම්භක, උපපීලක, උපඝාතක යනු ඒවාය. පුද්ගලයාගේ උපත සම්බන්ධයෙන් මූලිකවන්නේ ජනක කර්මයයි. උපත ලැබූ පුද්ගලයාට එම ජීවිතය පවත්වා ගෙන යාමට උපකාරීවන කර්මය උපත්ථම්භක කර්මය නම්. එම ජීවිතයට පීඩා පමුණුවන්නේ උපපීලක කර්මයයි. එම ජීවිතය විනාශ කිරීමට බලපාන කර්මය උපඝාතක කර්මයයි.

මෙසේ විග්‍රහකර ඇති බෞද්ධ කර්ම සංකල්පය ගැන මේ වන විට කොතරම් දේශනා පවත්වා ඇත්ද? පොතපත ලියවී ඇත්ද? නමුත් ඒ එකකින්වත් කර්මය ගැන සමාජය හරියටම දැනුවත් වී නැති බව පෙනේ. ඒ නිසා බොහෝ දෙනා ලොව සිදුවන සියලු හොඳ නරක ක්‍රියා කර්මයට පවරා කර්මය ඉදිරියේ රූකඩ බවට පත් වී සිටිති. බුද්ධිමත්ව කල්පනාකර බැලුවොත් මෙම කර්ම සංකල්පය ඉදිරියේ අප අසරණ විය යුතු නැත. ලොව සිදුවන සියලු ක්‍රියා උතු - බීජ - කම්ම - ධම්ම - චිත්ත වශයෙන් නියාම ධර්ම පහකට අනුව සිදුවන බව අප අසා ඇත. එම නියාම ධර්ම පහෙන් එකක් පමණි කර්මයට අනුව සිදුවන්නේ. එසේ නම් සියල්ල සිදුවන්නේ කර්මයෙන් නොවේ යයි සිතා ගත හැක. මේ සියලු දේ කර්මයට පවරා සිටින අයට නම් කර්මය කරුමයක් වී තිබේ.

අංගුත්තර නිකායේ ගිරිමානන්ද සූත්‍රයෙහි පුද්ගලයාට රෝග වැළඳෙන ක්‍රමරාශියක් උගන්වා ඇත. පිත කිපීමෙන්, වාතය කිපීමෙන්, සෙම කිපීමෙන් - වා පිත් සෙම් කිපීමෙන් දේශ ගුණ විපර්යාසයෙන්, නරක පැවැත්මෙන්, උපක්‍රම වලින්, කර්ම විපාකයෙන්, සීතලෙන්, උණුසුමෙන්, බඩගින්නෙන්, පිපාසයෙන්, මලමුත්‍ර කිරීමේ අපහසුවෙන්, රෝග වැළඳෙන බව කියයි. මේ විස්තරයෙහි කර්ම විපාකය එකක් පමණී. එසේ නම් සියලු රෝග කර්මයට පැවරීම සාධාරණ නැත. යමෙකු එම සියලු රෝග කර්මයට පවරා කටයුතු කළොත් ඔහුට එය කරුමයක් වනු ඇත.

සමාජය සාධාරණ යුක්ති ගරුක සමාජයක් බවට පත් කිරීමට වෙර දැරූ කාල් මාක්ස් තුමා ආගම ගැන මෙසේ ප්‍රකාශ කරයි.

"ආගම යනු පීඩිත මිනිසුන්ගේ සුසුමයි. හදවතක් නැති ලොවේ හදවතයි. ආත්මයක් නැති සවභාවයේ ආත්මයයි. එය ජනතාවගේ අබිංය." මාක්ස් තුමාගේ මේ ප්‍රකාශය බුදුදහම සම්බන්ධයෙන් අදාළ නොවේ. ඊට හේතුව බුදුදහම ආගමක් නොවීමයි. අප මෙහිදී ඉදිරිපත් කළ පුබෙබකතහෙතුවාදය - ඊශ්වර නිර්මාණ වාදය අහේතු අපපචචය වාදය යන ඉගැන්වීම් ආගම් ගනයට ගත හැකිය. ඒවා සම්බන්ධයෙන් නම් එතුමාගේ ප්‍රකාශය නිවැරදිය. කම්කරුවාගේ දුක සම්බන්ධයෙන් කථාකරන බුදු දහම කියන්නේ ඔහුගේ ශ්‍රමයට සරිලන සේ බත් වැටුප් දිය යුතු බවයි. සමහරු කියන්නේ බත් සඳහා වැටුප් කියාය. එය වැරදිය. බත් සහ වැටුප් දිය යුතුයි.

නූතනයේ බොහෝ දෙනා තම තමන්ට ඇතිවන දුක් පීඩා වලදී පුද පූජාවලට බරවී තිබේ. ඒ සියලුදේ සිදුවී ඇත්තේ පෙර කළ කර්මයට අනුව යයි  සිතා බොහෝ දෙනා මත්වී තිබේ. සමහරු ඒවා සර්වබලධාරී දෙවි කෙනෙකුට පවරති. සමහරු සලකන්නේ ඒවා ඉබේ සිදු වූ බවයි. මේ කියන අකිරියවාද වලට යටවී  නොපෙනෙන බලවේගවලට හසුවී ක්‍රියා කළොත් පුද්ගල පියුම අකාලයේ විනාශ වී යනු ඇත. ඒ නිසා හේතුඵල ක්‍රමයකට ඉදිරිපත් කර තිබෙන බෞද්ධ කර්ම සංකල්පය හඳුනාගෙන දෙලොව ජීවිතය සරුකර ගනිමු.

තෙරුවන් සරණයි... !

